


# මේ උයන් කොනේ


සිසිර දිසානායක

පසුගිය වසරේ මෙල්බන් නුවර පැවැත්වීමට යෙදුණ ''ඔබ මට තරුවක්'' ප්‍රසංගයට සහභාගී වීම සඳහා පැමිණි විශාරද නිර්මලා රණතුංග ගායහන ශිල්පිනිය ප්‍රසංගය දා උදේ වරුවේ මුණ ගැසෙන්නට අප හට අවස්ථාව ලැබිණ. ගායනය දායාද කොටගත් යොසුරියන් පෙළක සාමාජිකාවක ලෙස අප දැන හඳුනාගත් ඇයගේ හඬ එකී අනෙක් යොසුරියන්ගේ හඬට සො-යුරියන් දෙපළ වන මල්කාන්ති හා නෙරංජලාගේ හඬට පවා ස්වායත්ත වෙයි. අප අතරින් වියෝ වූ විශාරද තබ්ලා වාද්‍ය විශාරද විජේරත්න රණතුංගයන්ගේ ආදරණීය බිරිඳ වන ඇය ගැයූ ගී අතර මේ උයන්තෙරේ, මේ කෲර ලෝකයෙන් මිදී, අඹ ගස් යට මල් හැලිලා, (ආචාර්ය වික්ටර් රත්නායකන් සමග) ඔබ මට තරුවකි (ලක්-ෂ්මන් විජේසේකරයන් සමග) වැනි ගීත ජනාදරය ලබාගත් සදා මතකයේ රැඳුණ ගීත වෙයි. සන්නස මාසිකයේ ගී සඳළුව වෙනුවෙන් ඇය සිය මිහිරි කෝමළ හඬ අවදි කළාය. සිනහ මුසු මුවින්.

'මුලින්ම අහම්බෙන් තමයි මට ගුවන් විදුලියේ කරු අයියාගේ ළමා මණ්ඩපයට එකතු වෙන් ලැබුණේ.'

කරුණාරත්න අබේසේකර නිවේදකවරයා ඉදිරිපත් කළ ළමා මණ්ඩපයට ඇය ගියේ සිය සොයුරියන්ගේ තනියටයි.

''ඒ දවස්වල සතියේ දවස් පහේ ම මේ ළමා වැඩසටහන තියෙනවා. සජීවිවයි වැඩ සටහන කෙරෙන්නේ. ඒක වැහි දවසක ළමයි අඩු වුණා. ''නංගි අද සින්දුවක් කියන්න ඕන'' කියලා එදා කරු අයියා කිව්වා. ඉතින් ඒ ගායනය කළේ රෝහණ සිරිවර්ධනන් එක්ක. ඊට පස්සේ ළමා මණ්ඩපයේ ගීත ගයන්න අවස්ථාව ලැබුණා. ඔය අතරේ නන්දා අක්කා ළමා ගීත නාටකයක් කළා. ''රුවැති ළඳක්'' කියලා. එකේ ගීත ගයමින් රඟපාන්නත් මට අවස්ථාව ලැබුණා''

ඇය මේ සඳහන් කරන්නේ විශාරද නන්දා මාලනිය නිර්මාණය කළ ගීත නාටකයක් පිළිබඳවයි.

නිර්මලා ගුවන් විදුලියේ සරළ ගී පරීක්ෂණයට ඉදිරිපත් වූයේ 1976 දීය. එහිදී ඇය ''ඒ'' ශ්‍රේණියේ ගායන ශිල්පි නියක් ලෙස සමත් ව නූර්ති ගී, ජන ගී යනාදිය මැනැවින් ගයමින් ගායන කුසලතා දැක්වූවාය. ගුවන් විදුලියේ ''සංගීත පාඩම්'' වැඩසටහන තුළින් අ.පො.ස. සාමාන්‍ය පෙළ හා උසස් පෙළ විෂය නිර්දේශ අනුව ශ්‍රාවක සිසු සිසුවියන් දැනුවත් කළ ඇය අදටත් පෞද්ගලිකව සිසුනට උපකාර වන්නීය. දරු දැරියන්ගේ කට හඬ පුහුණු කරවීමට ඇය වඩාත් උන්නදු වන්නීය.

''ඒ ළමා වැඩ සටහන්වලට සහභාගී වෙන දක්ෂයින් ඉන්නවා. ඒත් ඒ තරඟවල වැඩිහිටියන්ගේ ගීතයි අහන්න ලැබෙන්නේ. මුල් තරඟවලින් තේරිලා ඉදිරියට යන අයව පුහුණු කරවන්නත් මට ඇරයුම් ලැබෙනවා. එහෙම වුණත් මම කැමතියි මේ ක්‍රමයේ වෙනසක් ඇති වෙනවානම්.''

''වැඩිහිටියන් ගේ ගීත විතරක් නෙවෙයි. ඒ හැසිරීම් පවා දරුවන් අනුකරණය කරන්න පෙළඹෙන නිසා මේ ළමයි බොහොම දෙනෙක් අතර ළමා හැඟීම් නෑ. වෙනත් ළමයින් වගේ සුරතල් කමක් නෑ. දෙමව්පියෝ මේ දරුවන්ව හොඳ තැනකට යොමු කළොත් ඔවුන්ව බේරාගන්න පුළුවන්. ඒ වයස සීමාවලට ගැලපෙන දේ තෝරාගන්න දෙමව්පියන් බුද්ධිමත් වෙන්න ඕනෙ.

''අපිත් මේ ගමන ආවෙ ලොකු අයගෙ ගීත ගයල ම නෙවෙයි. මට වයස අවුරුදු 12 විරත වෙනකොට ගෙදර හොඳ සංගීත පරිසරයක් තිබුණා. මගේ පියා ප්‍රවීණ මාධ්‍ය වේදියෙක්. නම හැරිසන් පීරිස්. ඔහුට එකෝඩියන් එක, ඉංග්ලිෂ් මැන්ටලින් එක වගේ දෙවල් වයන්න හැකියාව තිබුණා. අපි පල්ලියේ ගීතිකා එහෙම ගැයුවා. බී. වික්ටර් පෙරේරා, ප්‍රේමදාස මුදුන්කොටුව වගේ ආචාර්යවරුන්ගෙන් සංගීතය ඉගෙනගෙනයි සංගීත විශාරද උපාධිය ලබා ගත්තේ.

''කාලයක් මම නුගේගොඩ කලා භූමි කලායතනයේ ඉගැන්නුවා. පස්සේ මගේ ම පොඩි කලායතනයක් පටන් අරගත්තා. මුලින්ම සරළ ගී පරීක්ෂණයකට ඉදිරිපත් වෙන්න මාව උනන්දු කලේ අක්කා. සනත් අයියා තමයි මුලින් ම සප්ත ස්වරය කියා දුන්නේ. ඇය මේ සිහිපත් කරන්නේ මල්කාන්ති සහ මහාචර්ය සනත් නන්දසිරි යුවල පිළිබඳවයි.

''ඉන්දියාවෙන් ආව දීපාල්නාත් මහාචාර්යවරයා අපේ සංගීත පරීක්ෂණයේදී ලකුණු දුන්නේ'' මට ඉතින් ඉහළ ලකුණු ලැබුණා.'' විශාරදවරිය සිනාසුනාය.



''මෑත් කාලයේ පැවැත්වෙන තරඟ විනිශ්චය කරන්න මම ඉන්නවා.........'' විශාරද නිර්මාලා රණතුංග ශිල්පිනිය මේ සිහිපත් කරන්නේ ''සුපර් ස්ටාර්'' තරඟ පිළිබඳවයයි.

නිර්මලා රණතුංග විශාරදවරිය මේ වන විට ''මේ උයන් තෙරේ'', ''මා වෙනුවෙන්'', රෑ ''කඳුලින් සිනාවෙමු'',, ''තොරම්බල්'' යනුවෙන් සංගීත තැටි සතරක් ළි දක්වා ඇත.

''මට මුලින්ම යුග ගීයක් ගයන්නට ඇරයුම් ලැබුණේ වික්ටර් රත්නායක ශිල්පියාගෙන්. ''ස'' ප්‍රසංගයේ යුග ගායනාව වලටත් මම දායක වුණා. ''ගුරුගෙදර'' චිත්‍රපටයට අමරසිරි පීරිස් ශිල්පියා එක්ක ගායනා කරපවු ''මගේ මන්ද්‍රිනම්'' ගීතය ගයපු අවුරුදදේ හොඳම ගායිකාවට හිමි ස්වර්ණ සංඛ සම්මාණය ලැබුණා. ඉතින් ඔය අතරේ එංගලන්තය, ප්‍රංශය, ඉතාලිය වගේ රටවල්වල ප්‍රසංගවලටත් දායක වෙන්න ඉඩ ලැබුණා.

අවසන් වශයෙන් මෙහි වෙසෙන දරුවන් පිළිබඳව අදහස් දක්වමින් විශාරද නිර්රලා රණතුංග ශිල්පිනිය;

''මෙහෙත් ඉන්නවා දක්ෂ ළමයි. මෙල්බන් මුතුහර ළමා සමාජයේ දරුවන් එක්ක ගත කරපු ඒ වෙලාව අපිට හරි සතුටක් වුණේ ඒ නිසා. අපිත් ලෝබ නැතිව අපේ උපරිමය කළේ ඒ නිසා. වත්සලා ඉෂ්ඨවීර මහත්මිය ළමයින් වෙනුවෙන් ලොකු කැපවීමක් කරන බව පේනවා.

මෙහි දී අපට සහය දුන්න ඉන්ද්‍රජිත් මිරිහාන, ඩී.ඩී. ගුණසේන ඇතුළු හැම වාද්‍ය ශිල්පියෙක් ම ආදරයෙන් සිහිපත් කරනවා. ඒ වගේම අපට මෙහෙ ප්‍රසංගයකට ගෙන්වාගෙන නවාතැන් දෙමින් සත්කාර කරපු ලීල් බටුගෙදර සොයුරාටත් ඒ නැගණියටත් ස්තුති කරන්න ඕනෙ.

අධික වැඩ කටයුතු අතරේ ''ගී සඳළුව'' පාඨකයින් වෙනුවෙන් පිළිසඳරෙහි යෙදීමට අවස්ථාව ලබා දීම පිළිබඳව අපිදු නිශාන්ත ලීල් බටුගෙදර සොයුරාටත් ප්‍රිය බිරිඳටත් ස්තුති වන්නෙමු.

**මේ උයන් කොනේ - මේ තුරු සෙවනේ**
**ඔබේ කතා මට තවම ඇසේ**
**මේ නදී තෙරේ - මේ අඩි පාරේ**
**ඔබේ සිනා මට තව ම පෙනේ**

**ඔබ එදා කියූ වදන් ලියා ඇති සිතේ**
**නෑ ඉඩක් යළිත් සදා අන් සිතක් කෙරේ**
**අතරමගක මා දමා තනි ව ඒ ලොවේ**
**කොහෙ ද ඔබ ගියේ - කියන්න**
**කොහෙ ද ඔබ ගියේ ?**

**අප එදා පෙමින් වෙළී දෙපා නැගූ මගේ**
**නෑ තවත් මැකී ගියේ මුදු වදන් ඔබේ**
**යළිදු ඔබ එතැයි පතා හිඳිමි ඒ ලොවේ**
**කොහෙද ඔබ ගියේ - කියන්න**
**කොහෙද ඔබ ගියේ**

**රචනය : කුලරත්න ආරියවංශ**
**තනුව හා සංගීතය : ආචාර්ය වික්ටර් රත්නායක**
**ගායනය : විශාරද නිර්මලා රණතුංග**

VACANCIES
රියදුරු සේවය

අප ආයතනයේ අර්ධකාලීනව සේවය කිරීම සඳහා
මැනුයුඅල් (manual) වාහන පැදවිය හැකි
පළපුරුදු රියදුරු මහතකු අවශ්‍යයි

විමසන්න
0422 671 826